# ඩී.එස්. සේනානායක විදුහල, කොළඹ 07.

## දෙවන වාර පරීක්ෂණය - 2016
## 12 ශ්‍රේණිය
## සිංහල - I

කාලය පැය 3

01. එක් එක් ප්‍රශ්නයකට වඩාත් ම ගැලපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන තුළ ලියන්න.

1.1 ඝෝෂ මහප්‍රාණාක්ෂර සේ සැලකෙන්නේ කවරක්ද ?

i. ක, ච, ට, ත, ප ii. ඞ, ඤ, ණ, න, ම iii. ඝ,ඣ, ඪ, ධ, භ

iv. ඛ, ජ, ඨ, ථ, ඵ v. ය, ර, ල, ව (………)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

i. ගාම්භිර, කතිකාවත, සොබාවික, ඖදාර්ය
ii. සම්ප්‍රේෂණය, විශ්මය ජනක, ප්‍රසංගා, විරෝධාර
iii. විද්‍යාලයීය, මලල ක්‍රීඩා, සම්ප්‍රදාය, ආභාසය
iv. ජ්‍යොතිර්වේධය, සම්බාව්‍ය, විශිෂ්ට, මහලු
v. ඇඟළුම්, කණිෂ්ඨ, මර්ධනය, නිශ්කාෂණ

(………)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

i. කව්සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිලය, දහම්සොඬදා කව
ii. අමාවතුර, සද්ධර්මාලංකාරය, සද්ධර්මරත්නාවලිය, බුත්සරණ
iii. ලෝවැඩ සඟරාව, ලෝකෝපකාරය, වදන් කවිපොත, සුභාෂිතය
iv. ජාතක පොත, පූජාවලිය, පංචිකා ප්‍රදීපය, සද්ධර්මරත්නාකරය
v. කුවේණි අස්න, දළදා සිරිත, ධර්ම ප්‍රදීපිකාව, ධම්පිය අටුවා ගැටපදය

(………)

1.4 පහත සඳහන් වරණ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

i. කොම්බු දෙක සිංහලයේ "ඖ" කාරය වෙනුවට ව්‍යඤ්ජනයකට මුලින් පමණක් යෙදෙයි.
ii. කොම්බු දෙක සිංහලයේ ස්වරයක මුලට පමණක් යෙදෙයි.
iii. කොම්බු දෙක සඳහා ගයනුකිත්ත ද යෙදිය හැකිය.
iv. කොම්බු දෙක සිංහලයේ "ඓ" කාරය නියෝජනය වීම සඳහා ව්‍යඤ්ජනයක මුලින් පමණක් යෙදෙයි.
v. කොම්බු දෙක යෙදිය හැක්කේ "ඓ" කාරයට මුලින් පමණි.

(………)

1.5 යංශය, රකාරාංශය, රේඵය හා ගයනුකිත්ත සහිත වචන අනුපිළිවෙලින් යෙදී ඇති පද පේළිය තෝරන්න.

i. ප්‍රථම, සෞඛ්‍ය, වෛද්‍ය, කතෘ
ii. ප්‍රවර, ලෞකික, කාව්‍යාදර්ශය, අමනුෂ්‍ය
iii. ග්‍රහයා, ප්‍රත්‍යය, ඖෂධ, ධර්මය
iv. වක්‍රය, අද්‍යතන, මූලාශ්‍රය, භෞමික
v. විභක්ත්‍යාර්ථ, සම්ප්‍රදාය, වර්ගය, පෞරාණික

(………)

1.6 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

i. සම්භාව්‍ය සාහිත්‍ය , සොබා ධර්මය , විභක්ති ප්‍රත්‍යය , කර්ම විභාග

ii. අමාත්‍ය මණ්ඩලය , උවදුරු මර්දනය , සාහිත්‍ය උත්සවය , මාතෘ බාසා

iii. රාජ්‍ය අනුග්‍රහය , වංශ කතා , පූර්ව ස්වර , මිශ්‍ර කිරිය

iv. පුරා විද්‍යා , දිව්‍ය ලෝකය , මධ්‍ය විද්‍යාලය , සම්ප්‍රදාන විභක්තිය.

v. ධර්ම ද්වීප , සාහිත්‍ය පොත් , ප්‍රවෘත්ති ඇමති , ග්‍රන්ථ සැකැස්ම (..................)

1.7 මුලින් දී ඇති පදයට සමානාර්ථයක් නොදෙන පදයක් ද සහිත පද පේළිය තෝරන්න.

i. මෘදු - කෝමල , මටසිලිටි , සියුමැලි , ශිථිල

ii. වේගවත් - ශීඝ්‍රගාමී , අධිවේගී , ප්‍රවේගී , ජවාධික

iii. දෙවියා - සුර , අමර , මුරු , දිව්‍ය

iv. උදාර - උත්කෘෂ්ට , උත්තර , ශ්‍රේෂ්ඨ , උසස්

v. නැණවත් - පැනසර , ප්‍රඥාවත් , බුද්ධිමත් , නුනුවණ (..................)

1.8 මුලින් දක්වෙන පදයට විරුද්ධාර්ථයක් නොවන පදයක් ඇතුළත් වරණය තෝරන්න.

i. අවිනීත - සංවර , ශාන්ත , සන්සුන් , දමුණු

ii. ලක්ෂණ - කැත , විරූපී , සුන්දර , අශෝභන

iii. දොම්නස - තොස , සතුට , අමොද , සොම්නස

iv. විශාල - ස්වල්ප , කුඩා , කුෂුද්‍ර , කුඩු

v. උත්සාහය - අලස , කම්මැලි , අධෛර්ය , අනුත්සාහය (..................)

1.9 උක්ත පද දෙකක් හා අනුක්ත පද දෙකක් ද සහිත පද පේළිය තෝරන්න.

i. වෙළෙන්දෝ , සේවිකාවක , වළාවෝ , ගායිකාවෝ

ii. මිනිසා , උගුඩුවන් , බමරෙකු , මැණියන්

iii. කුරුල්ලෝ , ගුරුතුමියක , ශිෂ්‍යයෙක් , යක්ෂයන්

iv. බමුණෙක් , නයකු , ලෙඩ්ඩු , අරක්කැමියෝ

v. රෝහිනි , කොටි , දෙවියන් , කවියෙකු (..................)

1.10 පහත සඳහන් වාක්‍යවල අංකිත පද සඳහා නොගැළපෙන විභක්තිය සහිත වරණය තෝරන්න.

i. අපි <u>භික්ෂූන්ට</u> දන් දෙමු - සම්ප්‍රදාන

ii. ඔවුන්ට <u>දෙවියෝ</u> පිහිට වෙති - ප්‍රථමා

iii. <u>රජුගේ</u> පුතු රාජ සභාවට එයි - සම්බන්ධ

iv. අපි <u>මිතුරන්</u> ඇසුරු කරමු. - කර්ම

v. ළමයා <u>ගසෙන්</u> පැන්නේය. - කරණ (..................)

1.11 කෘදන්ත පදයක් අන්තර්ගත නොවන වරණය තෝරන්න.

i. බැලු , පිසමන් , හැඩිලි , නටන

ii. විඳී , වැටුණු , වැටලුම් , කළ

iii. හමන , තෝරන , විකුණු , ආවේ

iv. බලන , පරණ , මරන , කිරන

v. දක්කේ , හැරූ , වේලෙන , පුපුරන්නේ (..................)

1.12 තද්ධිත පදයක් නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

i. දෛවඥ , ඉන්දියානු , කරුණාවන්ත , අනාදිමත්
ii. අරටු , කැහැටු , වකුටු , ඇහැටු
iii. දිගටි , කරටි , ඉඟටි , පහටි
iv. සිඟිති , පොඩිති , කඩිති , මඩිති
v. දැහැමි , ග්‍රාමීය , දියඹ , දේශීය

(..................)

1.13 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

i. වමත , දකුණත , සුරිඳු , මලසුන
ii. වැසුම් , සැරසිලි , කැවුම් , අතිරස
iii. කොටියා , ගුණවතා , සිඟිත්තා , මැදිරිය
iv. හිරුසඳු, අමුරෙදි , අවගුණ , බුදුබණ
v. සහ , නො , සමඟ , අහෝ

(..................)

1.14 විභක්ති , විශේෂණ , දකාරාර්ථ , අව්‍යය යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති පේළිය තෝරන්න.

i. අකුසල් , අත්කම් , ඇළදොළ , නිලුපුල්
ii. අනුබල , නිල්මල් , කිරිබත් , ගීනැටුම්
iii. ගත්කරු , සුදුරෙදි , වතුපිටි , නොමිනිස්
iv. මාපිය , නවරස , බුදුගුණ , උපනගරය
v. අසුර , බරනෙත , ඇත්දළ , රත්මල්

(..................)

1.15 නිපාත පදයක් ඇතුළත් නොවන වාක්‍යය තෝරන්න.

i. මමත් දෙමාපියන් සමඟ ගමට ගියෙමි.
ii. ළමුන් සඳහා උද්‍යානයක් පිහිටුවා ඇත.
iii. මිතුරන්ගෙන් උදව් ලැබීමට අපි කරුණාවන්ත වෙමු.
iv. ගොවියා වහා කුඹුරෙන් ගොඩට පැමිණියේය.
v. ගුරුවරුන් විනා අපට යහමග කියා දෙන්නෝ කවුද ?

(..................)

1.16 උපසර්ගයක් යෙදී නැති පදයක් සහිත පද පේළිය තෝරන්න.

i. සමායෝජනය , සමාන්තර , සංතෝෂය , සම්භාෂණය
ii. නිරහංකාර , විශෝධනය , උදුල , අත්‍යවශ්‍ය
iii. අභ්‍යවකාශය , උගත් , උපකරණ , ආනයනය
iv. අවතල , අනුගමනය , ප්‍රශ්වාසය , උද්වේගය
v. ආමන්ත්‍රණය , සාදරයෙන් , ආරෝපණය , දුරවබෝධ

(..................)

1.17 පහත සඳහන් වැකිවල ඉරි ඇඳි පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙලින් දක්වා ඇති වරණය තෝරන්න.

* දරුවා හඬමින් ගෙදර යයි.
* වැසි වසිතොත් වැව පිරෙයි.
* අම්මා දරුවන් දුක හැඬුවාය.
* ගොවියෝ දරුවන් ලවා ගොයම් කපවති.

i. පූර්වක්‍රියා , අසම්භාව්‍යක්‍රියා , මිශ්‍රක්‍රියා , ප්‍රයෝජ්‍යක්‍රියා
ii. මිශ්‍රක්‍රියා , පූර්වක්‍රියා , ප්‍රයෝජ්‍යක්‍රියා , අසම්භාව්‍යක්‍රියා
iii. මිශ්‍රක්‍රියා , අසම්භාව්‍යක්‍රියා , පූර්වක්‍රියා , ප්‍රයෝජ්‍යක්‍රියා
iv. ප්‍රයෝජ්‍යක්‍රියා , පූර්වක්‍රියා , මිශ්‍රක්‍රියා , අසම්භාව්‍යක්‍රියා
v. අසම්භාව්‍යක්‍රියා , පූර්වක්‍රියා , ප්‍රයෝජ්‍යක්‍රියා , මිශ්‍රක්‍රියා

(..................)

ARTS අපි .XYZ

1.18 එකම වර්ගයට අයත් සන්ධි පද අන්තර්ගත වරණය තෝරන්න.

i. සත්නස් , දඬුවම් , ලිග්ගල , පත්තිරු
ii. අත්‍යවශ්‍ය , ජාත්‍යාලය , පෘථග්ජන , වියවුල්
iii. යතීන්ද්‍ර , මුනීන්ද්‍ර , ස්වාමීන්ද්‍ර , කවීන්ද්‍ර
iv. බුද්ධීන්ද්‍රිය , ගුරූපදේශ , වස්තූපමා , නරේන්ද්‍ර
v. විරෝදාර , වක්‍රෝක්ති , අංගෝපාංග , දෝෂාභියෝගය (..................)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

i. සමහරු විනෝදයට නොයෙක් නැටුම් නටති.
ii. සිරිසඟබෝ රජතුමා දැහැමි පාලකයකු විය.
iii. අපි මෙසේ කියතියි කවුරු විශ්වාස කරත්ද ?
iv. අප විසින් සමගි දම් රැකිය යුත්තෙමු.
v. විනිසුරුතුමා පැමිණිලිකරුගෙන් මෙසේ ප්‍රශ්න කළහ. (..................)

1.20 වඩාත් ම නිවැරදි පද බෙදීම සහිත වාක්‍යය තෝරන්න.

i. ජ්වර පිළිබඳ ව සිදුතේ දක්නට නොලැබෙන තවත් ප්‍රමෝදයක් සංස්කෘතවියරණ ඇඳුරෝ දක්වති.
ii. අධිකවර්ෂාව පැවතුණු හෙයින් කුඹුරුසියල්ල ම වතුරට යටවුණි.
iii. සිංහලජනවහර විද්‍යාත්මකවශයෙන් හැදෑරිය යුතු කාලය දැන් එළඹ තිබේ.
iv. ජාතක පොතෙහි ඇතැම් වර්තමාන වස්තුකෙටිකතාවට ළංවෙන තරම් නව්‍යස්වරූපයක් ගනියි.
v. වාක්‍යයක නාමපදයක් වෙනුවට යෙදෙන නාමය සර්වනාම යනුවෙන් හැඳින්වේ. (..................)

(ලකුණු 1 x 20 = 20)

## II කොටස

(02) අ) **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ඉතිහාසඥයන් උඩරට රාජධානිය කෙරෙහි දැක්වූ අවධානය ප්‍රමාණවත් නොවන බව ප්‍රකාශ කිරීම නිර්දය විවේචනයක් නොවනු ඇත. දහසයවන ශත වර්ෂයෙන් පසු ශ්‍රී ලංකා ඓතිහාසික අධ්‍යයනය මෑතක් වන තුරු ම පවත්වා ඇත්තේ යටත් විජිත රාමුව ඇතුළත, දිවයිනෙහි බාටහිර මුහුදුබඩ තීරුවෙහි පාලන බලය දරූවන් මුහුණ පෑ ගැටලු පිලිබඳවය. ඒ සෑම අධ්‍යයනයකම මහනුවර පිලිබඳ වටිනා යමක්, සිත් ගන්නා යමක් ඇතුළත් වන බව සැබෑය. එහෙත් මෙහිදී සැලකිල්ලට ගත යුතුව ඇත්තේ මහනුවර යනු ඔවුන්ගේ අවධානයෙහි සීමාවෙහි පිහිටියක් බවය. ඒවායේ මූලික අවධානය යොමු ව ඇත්තේ කෝට්ටේ රාජධානිය කෙරේ හෝ කෝට්ටේ රාජ වංශය අවසානයෙන් පසු එම බිම් පෙදෙස් පාතය කළ පෘතුගීසි හා ඕලන්ද ජාතිකයන් කෙරෙහිය. කෙටියෙන් කිවහොත් වැඩි වශයෙන් ලියවී ඇත්තේ යටත් විජිත ඉතිහාසය යි.

සිංහල රාජධානිය ස්වකීය ස්වාධීනත්වය ආරක්ෂා කර ගැනීමට වෙර දරූ ආකාරය කෙරෙහි ඔවුන්ගේ සැලකිල්ල යොමු වූයේ මඳ වශයෙනි. එසේ වුවද පසු ගිය දශක දෙක ඇතුළත එස්. අර්සරත්නම්, කේ. ඩබ්ලිව්. ගුණවර්ධන සහ ටිකිරි අබේසිංහ යන විද්වතුන්ගේ ලිපි ලේඛනවල නව ප්‍රවණතාවක් දක්නට ලැබේ. යටත් විජිත ඉතිහාසය ලියන අතරම, ඔවුහු දේශීය ආයතන කෙරෙහි ද දැඩි උනන්දුවක් දැක් වූහ.

උඩරට රාජධානිය පිළිබඳ ව වූ ඓතිහාසික ලිපි ලේඛන හිඟ වීමට විවිධ හේතු දැක්විය හැකිය. ලෞකික ඉතිහාසය ලේඛනගත කිරීමට දියුනු දේශීය සම්ප්‍රදායක් ශ්‍රී ලංකාවේ නොතිබීම එක් හේතුවක් වෙයි. උඩරට රාජධානියේ ලේඛනාගාරයට අයත් එක ද කඩදාසියක් හෝ තල්පත් ඉරුවක් හෝ සුරැකිව ශේෂ ව නොමැතිය. වැදගත් ලිපි ලේඛන රාශියක්ම බොහෝ විටට පන්සල් සතු පුස්තකාලවල හෝ පුද්ගලයන් සතුව හෝ විසිර පවතී. මේ හෙයින් උඩරට ඉතිහාසය හදාරන විද්‍යාර්ථීයාට, දිවයින පුරා විසිර ඇති දිරාපත් ලියකියවිලි අතර තම සාධක සෙවීමට සිදු වෙයි. එසේ නැතහොත් සම්පූර්ණයෙන් ම විදේශ මූලාශ්‍ර ආශ්‍රයෙන් තම අධ්‍යයනය කළ යුතු වෙයි. මේ දෙවැනි මග අනුගමනය කළහොත් උඩරට රාජධානියේ ඉතිහාසය දේශපාලනයට හා වාණිජමය වශයෙන් එයට සතුරු වූ ජාතියකගේ වාර්තා පදනම් කරගෙන ලිවීමට සිදුවෙයි.

i. උඩරට රාජධානිය පිළිබඳව ගැඹුරු ඓතිහාසික අධ්‍යයන හිඟ වීමට හේතු වශයෙන් මේ ලේඛකයා දක්වන කරුණු 2 ක් සඳහන් කරන්න.

ii. මේ ලේඛකයා ශ්‍රී ලංකාවේ ඉතිහාසඥයන් ප්‍රධාන වශයෙන් කී වර්ගයකට වෙන් කොට දක්වයි ද? ඔවුන් අතර පවතිනා මූලික වෙනස්කම් කවරේද ?

iii. ටිකිරි අබේසිංහ වැනි විද්වතුන්ගේ අධ්‍යයන, ඉතිහාසඥයින්ට වැදගත් වන්නේ කවර හෙයින් ද?

iv. ඉතිහාසය ලිවීම සඳහා යොදාගත් ප්‍රධාන මූලාශ්‍ර 2 ක් ගැන මේ ලේඛකයා සඳහන් කරයි. ඒ මොනවාද ?

v. 'නිර්දය විවේචනයක්' හා 'ලෞකික ඉතිහාසය' යන යෙදුම් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ) පහත දැක්වෙන උධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශ කොට ලියා එහි අග වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

උත්තම ගණයේ කාව්‍යයක කාල , දේශ , භාෂා ආදී සීමාවන් අභිබවන සාර්වත්‍රික ලක්ෂණ අන්තර්ගත වීම අපේක්ෂා කෙරේ. එවැනි කාව්‍යයකින් විශ්ව සාධාරණ රුචිකත්වයක් ද අපේක්ෂා කෙරේ. එංගලන්තයේ හෝ රුසියාවේ හෝ භාරතයේ හෝ ලංකාවේ හෝ කවර යුගයකට හෝ වේවා අයත් කෘතියක් කියවා අපට රස විඳිය හැකි වනුයේ එහෙයිනි. ඒ කාව්‍යය ලෝක සිතියමේ අබැටක් තරම් වූ කුඩා ලංකාවේ වෙසෙන සිංහල පාඨකයාට සාර්ථක ලෙස පරිවර්තනය වී ඇත්නම් තමන්ගේ බසින් වුව කියවා ස්වකීය අත්දැකීමක් බවට පත් කර ගැනීමට පුළුවන. ඒ කාව්‍යයෙහි ඉදිරිපත් වන චරිතයන්ට , ඔවුන් මුහුණ දෙන ගැටලුවලට තමාට ද පිවිසිය හැකි වනු ඇත. එහෙත් එවැනි කෘති පහළ වනුයේ කලාතුරකිනි. නිර්මාණ ලේඛකයාගේ ද අරමුණ වන්නේ ද සාර්වත්‍රික ලක්ෂණයෙන් හෙබි , විශ්ව සාධාරණ රුචිකත්වයක් ඇති කාව්‍ය බිහි කිරීම වේ.

මෙහි අනෙක් පැත්තක් ද ඇත්තේය. සිත්තරා සිතුවම් ඇඳීම සඳහා සායම් වර්ග උපයෝගී කර ගන්නා සේ ම කවියාගේ උපකරණය නම් භාෂාවයි. භාෂාවේ ඇති වචන සමූහයයි. ඒ වචන වල ඇති විවිධ අරුත් ඔහු ප්‍රයෝජනයට ගනියි. මේ වචන කාලයට , දේශයට , භාෂාවට අනුව වෙනස් අරුත් ගැනීම ස්වභාවයකි. කාලය දේශය භාෂාව පමණක් නොව ,ඒ ඒ පුද්ගලයාගේ රුචිය හා ගතිය අනුව ද වචන වල අර්ථ වෙනස් වේ. කවියා යොදෙන වචනයන්හි නියම අර්ථ තේරුම් ගැනීමට නම් ඒ කෘතිය පහළ වූ සංස්කෘතික පසුබිම පිළිබඳ අවබෝධයක් තිබීම අවශ්‍යයි. කාව්‍යයක් රස විඳීමේ දී එයට වස්තු වන ජනයාගේ ජීවිතය පිළිබඳ අවබෝධයක් ද තිබිය යුතුය යන්න ඇතැම් විචාරකයන් නොරුස්සන්නකි. එය පහළ වූ අවදියේ සාහිත්‍යය පිළිබඳ කවර නම් මත මතාන්තර පැවතේ ද, කවර නම් සිද්ධාන්ත බල පැවැත්තේ ද යන කරුණු පිළිබඳව විචාරකයා කුහුලක් දක්විය යුතුය යන්නත් ඇතැම් විචාරකයන් නොරුස්සන්නකි. මේ කරුණු වලට හේතු වී ඇත්තේ එක් සාධාරණ මතයක් කෙරෙහි ඔවුන් පමණ ඉක්මවා එල්බ ගෙන සිටීමය. එනම් සාහිත්‍යය කෘතිය දෙස බැලිය යුත්තේ අද ජීවත් වන්නෙකු ලෙස තමාගේම ඇසිනි.

(ලකුණු 15 යි)

(03) දී ඇති මාතෘකා වලින් එකකට අදාළව වචන 300 - 350 ක් අතර වනසේ ව්‍යාකරණානුකූල විශ්ලේෂණාත්මක රචනාවක් ලියන්න.

i. පුද්ගල චරිත සංවර්ධනයෙහි ලා සාහිත්‍යයේ කාර්යභාරය.

ii. වත්මන් විභාග මූලික අධ්‍යාපනය හමුවේ අසරණ වන අපේ දරුවෝ.

iii. මානව වර්ගයාගේ අනර්ථයට හේතුවන නවීන විද්‍යාව.

iv. ජනමාධ්‍ය සතු සමාජ වගකීම.

v. පරිසර විනාශය හමුවේ වර්ධනය වන ස්වාභාවික ආපදා.

(ලකුණු 25 යි.)

(04) අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

i. අනාගත නායකයන් ප්‍රඥාවන්තයන් වෙත්වා !

ii. 'ඉන්දියානුවෝ න්‍යෂ්ටික ආයුධ නිපදවතියි පකිස්ථාන් ජාතිකයෝ නොසිතූහ.

iii. විශාඛා කොමෙර් සන්සුන් ගමනින් ගමන් කරති.

iv. ශ්‍රී ලාංකිකයෝ ප්‍රෞඪ සංස්කෘතියක උරුමක්කාරයන් වෙති.

v. බස්රථ හා වෙනත් වාහන දහස් ගණනක් උදේ සවස කොළඹ නගරයට ඇතුළු වෙති.

(ල. 5 යි)

ආ. නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i. හින්දු (භක්තිකයෝ/භක්තියන්) වැඩි (දෙනෙකු/දෙනෙක්( හරක්මස් කෑමෙන් වැලකී සිටිති.

ii. (අප/අපි) කිහිප දෙනෙක් (නිළියක්/නිළියකා) හමු වීමට ගියෙමු.

iii. කුඩා (දරුවෝ/දරුවන්) කියන බස් (වැඩිහිටියන්/වැඩිහිටියෝ) ගණන් ගන්න් නැත.

iv. ආනන්ද මෛත්‍රිය (නාහිමියෝ) මුරුම රජයෙන් උපහාර (ලබයි/ලබති)

(ල. 05 යි)

ඇ. පහත දැක්වෙන වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

i. පැරණි සිංහල රජවරු සංස්කෘත පොත් පවා සිංහලයට පරිවර්තනයට කළහ.

ii. නූතන නාට්‍ය විචාරකයෝ ප්‍රේක්ෂකයා දැනුවත් කරති.

iii. මහිලා සමිති නිලධාරිහු නව සභාපතිවරියක තෝරූහ.

iv. සාහිත්‍ය කෘතිහු චමත්කාරයෙන් රසිකයන් පිනවති.

v. ප්‍රවීණ ජනමාධ්‍යවේදිනියක් මහත් හරසරින් මා පිලිගත්තාය.

(ල. 05 යි)

(ලකුණු 15 යි)

05. අ. පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි පදවල අර්ථ විග්‍රහ කර ලියන්න.

i. කාව්‍යයක වැදගත් වන්නේ <u>ධ්වනිතාර්ථයයි.</u>

ii. අනුරාධපුරය අසලින් <u>මෙහෙණවරක</u> නටබුන් හමුවී ඇත.

iii. <u>සර්වතෝභද්‍ර</u> පුද්ගලයන් මේ ලෝකයේ පහළ වන්නේ කලාතුරකිනි.

(ල. 03 යි)

ආ. පහත දැක්වෙන යෙදුම්වලට වඩාත් සුදුසු තනි පද ලියන්න.

i. ඉතිහාසයට අයත්

ii. වසර සියයක කාලය

iii. බොහෝ ඇසුපිරූ නැණ ඇති

ඉ. පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

i. භාෂාව ඉගැන්වීම සඳහා ..................................ගුරුවරුන්ගේ අවශ්‍යතාව කැපී පෙනේ.

ii. දෙමාපියන් .................................. අවධියේ පසුවන දරුවන් ගැන විශේෂ අවධානයක් යොමු කළ යුතුය.

iii. අන්තර් ක්‍රීඩා සමාජ ක්‍රිකට් තරඟාවලදී ලකුණු දහස ඉක්ම වූ හෙතෙම .................................. ක්‍රීඩකයෙකි.

iv. රණවිරුවෝ මවුබිම සුරැකීමේ .................................. කාර්යයෙහි නියැළෙති.

v. රටක් ගොඩනැගීමට නම් දූෂණයෙන් තොර ..................................නායකත්වයක් අවශ්‍ය බව ඇතැමුන්ගේ පිළිගැනීමයි.

vi. හෙතෙම .................................. වියේදීම කෙටි කතාකරණයට පිවිසියේය.

(යෞවන, දක්ෂ. යොවුන් ප්‍රවීණ, උදාර, එඩිතර)

(ල. 03 යි)

ඊ. ඉරි ඇඳ දක්වා ඇති බහු අර්ථ පදය යොදා වෙනත් අරුතක් දෙන ලෙස වාක්‍යය බැගින් තනන්න.

i. <u>පිය</u> සෙනෙහසට කවි ගී ලියවුණා මදි.

ii. වනයෙහි පිපුණු මල්වල සුවඳ <u>සතර</u> අත පැතිරෙයි.

iii. ගව් <u>සිය</u> දහසක් කතර ගෙවා ගෙන.

iv. මිනිසුන් අතර විවිධ <u>මත</u> පවතී.

v. පසළොස්වක පොහොය දිනවල <u>මස්</u> පිණිස සතුන් මැරීම තහනම්ය.

vi. මගේ පියා <u>කඩ</u> හිමියෙකි.

(ල. 06 යි)

06. අ. පහත දැක්වෙන උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. (පිළිතුරු ලිවීමේදී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදාගන්න)

1. පෙරාතු දවසක දී සිටාණෝ රජගෙට ගොසින් එන තෙනැත්තෝ එක් සාකුස් ඇති දනවු මිනිසෙකු කුම්මාසයන් පිරුණු කබලුපුවක් කන්නවුන් දැක සම්පත් මහත් වුවත් අදහස කුඩා හෙයින් ඒ කබලුපුවෙහි රුචියක් ඇතිවගෙන තමන්ගේ ගෙට ගොසින් ඉඳින්

කබලූ පුවක් කනු කැමැත්තෙමි. කිමි නම් මා කැමති වුවා සේම බොහෝ දෙනත් කන්ට සිතා ගනිති. එසේ කලට මාගෙන් බොහෝ සාල් හා කිරි පැණි සකුරු ආදි වූ බොහෝ දෙයට අළුවි පෙනෙයි. කිසි කෙනෙකුන්ටවත් නොකියමි.යි. සම්පත් ඇති නියාව කාටත් නොහඟවන්නා සේ ම කබලූවට කළ ආලයත් සිදුටු දුවණියත් පමණකටත් නොහඟවති. නොහැඟවීමෙන් කල් යත් යත් කසායුස වත් කොට පිසූ කබලූපු සේ පඬුවන් පැහැ ඇති විය නොතර මාලූ කඩෙක වැල් පැදලූ කලක් මෙන් ඇඟ නහරවැලූත් ඉපිළ ගියේය.

i. රජගෙට ගොස් එන සිටුතුමා දුටු දසුන කුමක්ද ?
ii. කබලූ කෑමට ඇති වූ ආශාව සු දියණියටවත් නොකීවේ ඇයි ?
iii. කබලූ කෑමට ඇතිවූ ආසාව සිතේ සඟවාගෙන සිටීමෙන් අසනීප වූ සිටු තුමාගේ ශරීරයේ බාහිර පෙනුම කතුවරයා විස්තර කරන්නේ කෙසේද ?
iv. "නොතර මාලූකඩෙක" යන්නෙහි අර්ථය දක්වන්න.

ආ. උන් සොළොස් හැවිරිදි වයස දී මිථ්‍යාචාරයෙන් නවතනු නිසා සත්මාල් පායේ උඩු මාගේ ශ්‍රී යහන් ගබඩාවෙක ලා රකිති. එසේ වුවත් ඌ තුමු තමන්ගේ ම ගෙයි කොල්ලකු හා බැඳී වෙසෙති. උන්ගේ දෙමව්පියෝ ජාතිනුත් සම්පත්තිනුත් සම තරම් වූ සිටුපුත්‍රයාණ කෙනෙකුන්ට සරණ දෙන්ට නියම ව දවස් නියම කළහ. නකත්දවස් උදා වූ කලට සිටු දුවණියෝ බැඳී වසන කොල්ලාට කියන්නේ "මා අවසල් දවස් අසවල් සිටුපුත්‍රයාණන්ට සරණ දෙති. මා උන් කරා සරණ ගිය කල පඬුරක් හැරගෙන ගිය නමුත් ඔබිනුත් වෙන ම රකවල් හෙයින් දක්නා පමණකටත් නොලබව, ඉදින් මා කෙරේ ප්‍රේමයෙක් ඇත්නම් ඔබ නොයන තෙක් දැන් ම මා කැඳවාගෙන කැමති තැනකට යව'යි කිවුය. උයිත් යහපතැයි ගිවිස" එසේ වී නම් මම සෙට දවස් නුවර වාසල කෙරේ අසවල් තැන සිටිමි. මුඹත් එක් උපදෙසකින් කාටත් නොහැඟෙන ලෙස එතැනට අවමැනවැයි කියාලා දෙවන දවස් කියාලූ තැන ම සිටියහ. සිටුදුවණියෝ ද දෙවන දවස් කිලූටු අදහස් සේ ම කිලූටු කඩරෙද්දක් කොයින් දෝ සොයා හැඳගෙන මිඩියන්ගේ ලෙසට ලිහිල් කොට හිසකේ බැඳගෙන රැ දෙවරු "**වී පැහැරීයා සේ**" ඇඟ මුළුල්ලෙහි ධූලි ගාගෙන කළයක් හැරගෙන පැනට යන කෙල්ලක මෙන් කෙල්ලන් හා එක් ව ගෙන් පිටත් ව මිඩිවෙස් ගත් ලෙසට කොල්ලා සිටි තැනට ගියහ.

i. උන් සත්මාල්පායේ උඩුමාලේ ශ්‍රී යහන් ගබඩාවේ තබා ආරක්ෂා කළේ කවර හෙයින් ද ?
ii. අය කොල්ලා සමඟ යන්නට තිරණය කළේ කවර හේතුවක් නිසා ද ?
iii. දියණිය සරණ දෙන්නට අවශ්‍ය කරුණු ලෙස දෙමාපියන් සිතුවේ මොනවාද ?
iv. "**වී පැහැරීයා සේ**" යන්නෙහි තේරුම ලියන්න.

(ල. 04 යි)

07. පහත දැක්වෙන කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් සපයන්න.

හදිස්සියක් වූ විට එක්තරා හඬක්
නඟා සියල්ලන් එක රැස් කරත් තෙපි
නයින් පොළොන්ගුන් දැක අන්තරාවකැයි
දැනුම් දෙති අන් හඬකින් අපුරුවයි

ගසක් වැලක් හෝ ගොමුවක් කරා ගොසින්
බොහෝ දෙනා මල් පැණි බී උදම් බැවින්
අතුත් ඉතිත්හි රඳමින් යමින් එමින්
ගයත් එකා වන් තුටු ගී අපුරුවයි

කුසුම් වනේ රුක් මුදුනේ ගුවන් ගැබේ
වහල් පළේ හෝ පොළොවේ කැදැල්ලෙහිත්
එකින් එකාගේ අනුරාග ගායනා
කලේ සියල්ලෝ හඳුනත් අපුරුවයි

වියෝගයක් වූ විට සිත් තැවුල් බැවින්
අමිරි වූ සෝක හඬක් නඟත් තෙපි
බයක් සැකක් නම් එය දන්නමින් අනෙක්
හඬක් නහන්නාහු මෙයත් අපුරුවයි

කිසිත් හඬක් දැන් අරුණෝදය යි කියය්
අනෙක් හඬක් දැන ඉරිමා උදෙයි කියය්
තවත් හඬක් දැන් එළි වී තිබෙයි කියය්
සියල්ලෝ මත් මේ හඬවල් හොඳින් දනිත්

කිසිත් හඬක් වැස්සට කල් වනැයි කියය්
අනෙක් හඬක් මල් පල ගැන්වෙනැයි කියය්
තවත් හඬක් ගිම් කල ළං බවක් කියය්
සියල්ලෝ මත් මේ හඬවල් හොඳින් දනිත්

(ල. 10 යි)

08. ධර්මසේන හිමියන් ගැමි ජන ජීවිතය හා බැඳුණු උපමා රූපක යොදමින් කථාවක් සාර්ථක ලෙස ඉදිරිපත් කරන්නට මහත් හැකියාවක් දැක්වූවෙකි. උදාහරණ දෙමින් විමසන්න.

(ල. 15 යි)

ARTS අපි .XYZ